## ඌව පළාත් සභාව 2012

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(අ) **පළාත් සභා අරමුදල**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2013 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

(ආ) **අනෙකුත් ගිණුම්**

සමාලෝචිත වර්ෂයට අදාලව 2013 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2012 වර්ෂයට අදාල | | | |
|---|---|---|---|---|---|
| | | **මුළු ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව** | **ඉකුත් වර්ෂ වලට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව** |
| (i). | විසර්ජන ගිණුම් | 27 | 27 | නැත | නැත |
| (ii). | ආදායම් ගිණුම් | 01 | 01 | නැත | නැත |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 28 | 22 | 06 | 06 |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 09 | 03 | 06 | 02 |
| (v). | අරමුදල් ගිණුම් | 08 | 05 | 03 | 30 |
| (vi). | ප්‍රඥප්ති ගිණුම් | 03 | නැත | 03 | 28 |

1.2 **මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබුණු අතර, එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සටහන් මගින්ද හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඌව පළාත් හදිසි අවස්ථා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල රු.8,734,156 ක්වූ අතර ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඊට අනුරූපී ශේෂය රු.7,555,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 1,179,156 ක වෙනසක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 442,064,868 ක්වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන කරනු ලැබේ.

(i) සෙවණගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා සුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් එකතුව රු.1,136,304 ක් වූ හර ශේෂ පැවැතුණි.

(ii) ආයතන 08 කට අයත් එකතුව රු.284,489,182 ක් වූ බැර ශේෂ හා එක් ආයතනයකට අයත් රු.1,106,304 ක්වූ හර ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ආයතන 33 ට අදාල එකතුව රු.37,922,945 ක් වූ වර්ෂ 02 ඉක්මවූ බැර ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් මූල්‍ය වත්කම් යටතේ වූ දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.43,404,681 ක්වූ ණයගැති ශේෂ හා විවිධ ගිණුම් යටතේ දක්වා ඇති රු.4,300,000 ක්වූ දීර්ඝ කාලයක සිට පැවත එන ණයහිමි ශේෂ 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඉ) 1989 අංක 02 දරන සමාජ සුභසාධන පුනරුත්ථාපන අරමුදල් ප්‍රඥප්තියට අනුව පිහිටුවා තිබුණු ඌව පළාත් සමාජ සේවා අරමුදලේ ජංගම බැංකු ගිණුම 2011 අගෝස්තු 11 දින වසා එහි තිබු රු.53,748 ක මුදල 2012 මාර්තු 14 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත ගෙවා තිබුණි. ඒ අනුව 2011 අගෝස්තු 11 දින සිට මෙම අරමුදල ක්‍රියාත්මක නොවූ අතර 2012 වර්ෂයේ ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ රු.46,252 ක ශේෂයක් දක්වා තිබුණි.

(ඊ) 2012 දෙසැම්බර් 31 දිනට අනුමත අත්තිකාරම් ගිණුම්වල එකතුව රු. 44,752,087 ක ශේෂය තුළ 2005, 2006 හා 2007 වර්ෂවලට අයත් ගිණුම්කරණ දෝෂ ලෙස හඳුනාගෙන තිබුණු දියතලාව දිසා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයට අයත් රු. 21,721,200 ක අත්තිකාරම් ශේෂය 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වල රු.886,861,328 කවූ ශේෂ එකතුව තුළ ගිණුම් 08 කට අදාල වර්ෂ 10 ඉක්මවූ එකතුව රු.4,389,721 ක්වූ හර ශේෂද, එකතුව රු. 1,115,681 ක් ව නිරවුල් නොකළ බැර ශේෂයද 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඌ) 2012 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී තිබුණු එකතුව රු.98,809,444 ක්වූ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස දක්වා තිබුණි.

### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් අඩු අගයට අවසන් තොගය ගිණුම්ගත කළ යුතු වුවත්, බොරලන්ද සත්ව ගොවිපලේ 2012 දෙසැම්බර් 31 දිනට වූ තොග අයිතම 06 ක රු.11,848 ක් වූ විකුණුම් මිලට අගය කර ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කර ඇති බව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 02 යටතේ දක්වා තිබුණි. ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 06 යටතේ ආදායම් ගිණුම්ගත කිරීමේදී එකතු කරගත් කාල පරිච්ඡේදය අනුව සිදුකර ඇති බවත් වර්ෂයට අදාල ආදායම උපචිත පදනම මත හැකිතාක් දුරට ගිණුම්ගත කර ඇති බවත් දක්වා තිබුණ.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පොත්වල දැක්වෙන පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුම් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 06 ක් විසන් ඉදිරිපත් කළ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන එදිනට අනුරූපී ශේෂවල එකතුව අතර රු.8,162,972 ක වෙනසක් විය.

(ආ) ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 කට අදාල පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශය අනව ශේෂයන්ගේ එකතුව රු.666,838,955 ක්වු අතර ණය හා අත්තිකාරම් පාලන ගිණුම් අනුව රු.671,889,246 ක් විය. ඒ අනුව රු.5,050,291 ක වෙනසක් වී තිබුණි.

1.3.4 **පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් කෘෂකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, පරිසර සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම අනුව 2012 වර්ෂය තළ මුළු බැර කිරීම් රු.6,903,596 ක් වුවත්, සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු බැර කිරීම් රු.7,054,127 ක් වුයෙන් රු.150,531 ක වෙනසක් වී තිබුණි.

(ආ) ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුමේ සටහන II හි දැක්වෙන පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හර හා බැර ශේෂ පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සමඟ පිළිවෙලින් රු.11,950 කින් සහ රු.345,070 කින් වෙනස් වී තිබුණි.

1.3.5 **අග්‍රිම ගිණුම්**

අග්‍රිම ගිණුම් 10 කට අදාලව එකතුව රු.3,356,412,477 ක් වූ අග්‍රිම ශේෂ 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 1.3.6 පොදු තැන්පත් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණ කාර්යාල 11 කට අදාල එකතුව රු.7,786,353 ක් වූ තැන්පත් ශේෂ 333 ක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් සහ බෙදාහැරීම් අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් රු.340,269 ක ශේෂ විය.

(ඇ) ඌව පළාත් සභාවේ කාර්යාල කාර්ය සහයක සේවකයින් කළමනාකරණ සහකාර සේවයට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය අවලංගු කිරීම නිසා ප්‍රතිපූර්ණය කළ යුතු රු.243,920 ක වියදම් 2011 දෙසැම්බර් 26 දින පොදු තැන්පත් ගිණමට බැර කර තිබුණි. එම විභාගය නැවත නොපැවැත්වීමට තීරණය කර තිබූ නමුත් විගණිත දිනය වූ 2013 මාර්තු 31 දින වන විටත් එම මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති හා පේෂ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් සටහන් අංක 41 අනුව පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.20,149,483 ක් වුවත් පාලන ගිණුම් අනව අනුරූප ශේෂය රු. 20,669,450 ක් වීම නිසා රු. 519,967 ක වෙනසක් විය.

(ඉ) බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ 110 ක එකතුව රු.24,752,085 ක හඳුනානොගත් ශේෂ වූ අතර, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ නමින් අවසථා 15 කදී තැන්පත් කරන ලද රු.3,669,049 ක්ද අවස්ථා 31 කද අයකරගත් අග්‍රහාර රක්ෂණ වාරික රු.250,889 ක්ද නිරවුල් නොකර 2013 පෙබරවාරි 12 දින දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) 2008 සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍යාවකට ජනාධිපති අරමුදලින් පිරිනමන ලද ශිෂ්‍යත්ව මුදල් රු. 6,000 ක් ද, රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු රු. 5,004 ක දායක මුදල් කලාපයේ පාසැල් වෙත නිකුත් කරන ලද නමුත් ප්‍රයෝජනයට නොගෙන ආපසු හරවා එවන ලද ගුණාත්මක යෙදවුම් මුදල් රු. 11,579,143 ක්ද දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පස්සර කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(උ) පළාත් සභාවේ දෙපාර්තමේන්තු 02 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.51,080,887 ක්වූ අතර මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.50,086,534 ක් වී තිබණි. ඒ අනුව රු.994,353 ක වෙනසක් විය.

(ඌ) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන ගිණුම් සාරාංශ වාර්තාවේ පොදු තැන්පත් ගිණුමේ වර්ෂයේ ආරම්භක ශේෂ හා වර්ෂයේ අවසාන ශේෂය, මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තු පොත් අනුව වූ ඊට අනුරූපී ශේෂයන් සමඟ පිළිවෙළින් රු.119,608,295 කින් හා රු.244,755,575 කින් නොසැසඳුනි.

### 1.3.7 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ ගිණුම් අනුව, ඌව පළාත් මුද්‍රණාලයේ අත්තිකාරම් කටයුත්තෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.2,932,993 ක් විය.

(ආ) 1991-2004 කාල පරිච්ඡේදය තුළදී රජයේ ආයතනවල සේවකයින් 868 දෙනෙකු සඳහා ණයට විකුණු රෙදිපිළිවලින් පේෂකර්ම අත්තිකාරම් ගිණුමට රු.2,765,672 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

### 1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2012 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 07 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.3,452,613,953 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.80,570,890කවූ ගනුදෙන විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ii) බදුල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2012 වර්ෂයේ සියලු වැය ලෙජරයන් තුලනය කර, යාවත්කාලීන කර නොතිබුණු බැවින් වැය විෂයන්හි වියදම් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි වී තිබුණි.

### 1.3.9 අනුකූල නොවීම්

#### (අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (i) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| • XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | - | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියලුම නිල නිවාසවලින් ආර්ථික කුලිය අය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| • XIX පරිච්ඡේදයේ 6.14 සහ 7.2 වගන්ති | 26,005 | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 01 දින සිට 2012 සැප්තැම්බර් 01 දින දක්වා මාස 13 ක කාලයක් නිල නිවසේ පදිංචි වී සිටි නිලධාරියෙකුගෙන් දණ්ඩන කුලී අයකර ගෙන නොතිබුණි. |
| • XXIV පරිච්ඡේදයේ 3.5 වගන්තිය | 2,679,766 | ඌව පළාත් සභාවේ ආයතන 09 කින් සියයට 40 අවකරණ සීමාව ඉක්මවා නිලධාරීන් 63 කට ආපදා ණය ලබාදී තිබුණි. |
| • XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | 120,120 | ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුමේ හර ශේෂයන්ට ඇතුළත් අය නොවී පවතින ණයගැති ශේෂ අදාල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| • XXIV පරිච්ජේදයේ 7.5 වගන්තිය | 158,719 | ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් නිලධාරියෙකුට ඉඩමක් මිලදී ගැනීම සඳහා ණය මුදලක් ලබාදී තිබුණි. එම ණය මුදල අදාල කාර්යයේ යෙදූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත බලය පැවරූ ඇටර්නි බලපත්‍රය සහ ඉඩමේ ඔප්පුව 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර එම ණය මුදල ආපසු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ii) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 571(3) | 3,780,618 | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වසර 02 ක් ඉකුත් වූ තැන්පත් 201 ක් නියාදනය කර නොතිබුණි. |
| **(iii)** **ඌව පළාත් සභා මුදල් රීතී සංග්‍රහය** | | |
| • පළාත් සභා මුදල් රීති 104 | 143,800 | 2012 මාර්තු 06 දින අනතුරකට පත්ව තිබ ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාහනයක් සම්බන්ධයෙන් මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 133 | - | සමලෝචිත වර්ෂයේදී ඔක්කම්පටිය බීජ ගොවිපලේ හා ආණ්ඩුකාරවරයාගේ අරමුදලේ ගනුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් කියාත්මක කර නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 271.2.2 | 668,812 | අවස්ථා 23 කදී නොගෙවූ ගුරු වැටුප් 2004 ජුලි 28 දින සිට බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| • පළාත් සභා මුදල් රීත 371.2.2 | 485,014 | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා අමාත්‍යාංශයක හා පළාත් දෙපාර්තමේන්තු දෙකක නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 12 කදී ගෙවා තිබුණු අතුරු අග්‍රිමයන් 2013 ජනවාරි 31 දින වන විටත් පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| • පළාත් සභා මුදල් රීති 371.2.7 | 181,000 | පළාත් සභා අමාත්‍යාංශයක් විසින් 2011 වර්ෂය තුළ අවස්ථා 07 කදී ගෙවා තිබුණු අතුරු අග්‍රිම 2013 ජනවාරි 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 504.1 | - | ඌව පළාත් මුද්‍රණාලයේ වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් කාර්තුව අවසානයේදී නියමිත සීමා පිළිපැද ඇති බවට මුදල් රීති ප්‍රකාර ප්‍රකාශයන් පිළියෙල කර විගණකාධිපතිටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 757(2) සහ (3) | | මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 10 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හදුනාගෙන තිබුණු උපකරණ 496 ක ඌණතා සම්බන්ධව 2013 අප්‍රේල් 22 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 772(1) | | මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 05 ක ප්‍රයෝජනයට ගත නොහැකි හා විනාශ කිරීමට නිර්දේශ කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් 2013 අප්‍රේල් 22 වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| • පළාත් සභා මුදල් රීති 896 | - | පළාත් සභාවේ ආයතන 14 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. |

(iv) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| • 1990 ඔක්තෝබර් 18 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | පළාත් සභා අමාත්‍යාංශයක් හා පළාත් දෙපාර්තමේන්තු දෙකක් විසින් වාහන 11 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනයවීම පරීක්ෂා කර නොතිබුණි. |
| • 1996 මාර්තු 15 දිනැති අංක 08/96 දරන චක්‍රලේඛය | 425,386 | ඇප කොන්දේසිවලට පටහැනිව පළාත් දෙපාර්තමේන්තු දෙකක නිලධාරීන් 08 දෙනෙකුට ආපදා ණය ගෙවා තිබුණි. |
| • 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛය | - | පළාත් සභා අමාත්‍යාංශයක අමාත්‍ය කාර්ය මණ්ඩලය වේලා සටහන් යන්ත්‍ර මගින් සේවයට වාර්තා කිරීම සනාථ කර නොතිබුණි. |

(v) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | 170,100 | ඔක්කම්පිටිය බීජ ගොවිපල, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල සහ පාසල් වල පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. |

(vi) **වෙනත් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| • 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009/02 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | - | ඔක්කම්පිටිය බීජ ගොවිපලේ වත්කම් සඳහා පොදු 287 ආකෘතිය පරිදි පවත්වාගත යුතු වත්කම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ආ) **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2012 වර්ෂයේදී ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බලශක්ති හා පේෂකර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය භාර ඇමතිවරයා හා ලේකම්වරයා විසින් උපයා ගනු ලැබූ අමතර දීමනා හා වෙනත් ඉපයීම් මාසික පාර්ශ්‍රමිකයට ඇතුළත් නොකර උපයන විට බදු ගණනය කිරීම හේතුවෙන් රු.351,277 ක බදු මුදල් අඩුවෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර තිබුණි.

## 1.3.10 අත්තිකාරම් ගිණුම් සීමාවන් නොපිළිපැදීම්

(අ) ඌව පළාත් සභා මුදල් රීති 503 හි නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 ක වියදමෙහි උපරිම සීමාව රු. 88,950,854 කින් ඉක්මවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| විෂයය අංකය | අත්තිකාරම් කාරණය | වියදමේ උපරිම සීමාව | තථ්‍ය වියදම | සීමාව ඉක්මවීම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 70601 | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,505,000 | 5,000 |

| | | | | |
|---|---|---|---|---|
| 71001 | - එම - | 70,000,000 | 156,220,305 | 86,220,305 |
| 72601 | - එම - | 9,000,000 | 11,725,549 | 2,725,549 |
| එකතුව | | | | 88,950,854 |

(ආ) විෂයයන් 10 ක හර ශේෂයේ උපරම සීමාව රු.168,933,981 කින් ඉක්මවා තිබුණ අතර විෂයයන් 02 ක ලැබීම්වල අවම සීමාව රු.825,115 කින් පහත වැටී තිබුණි.

## 2. ආදායම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව පිළියෙල කර තිබු හිඟ ආදායම් පිළිබඳ වාර්තාව අනුව 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු. 202,778 ක් විය.

(ආ) ඌව පළාත් ආදායම් කොමසාරිස් නමින් පවත්වාගෙන යන රැස්කිරීම් ගිණුම්වලට සමාලෝචිත වර්ෂය තුළදී ලද ආදායම් සහ ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය රැස්කළ ආදායම් එකතුව රු.99,872,887 ක් වර්ෂයේ ඒකාබද්ධ ආදායමට ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.330,988,908 ක ඌනතාවයක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.501,381,768 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.832,370,676 කින් පිරිහී තිබුණි.

### 3.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | සත්‍ය | විචලනය | අයවැයගත | සත්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයන්ට අදාල ආදායම්** | | | | | | |
| බදු ආදායම් | 1,468,098,000 | 1,692,690,962 | 224,592,962 | 827,326,000 | 1,503,998,803 | 676,672,803 |
| බදු නොවන ආදායම් | 667,902,000 | 410,288,846 | (257,613,154) | 408,674,000 | 303,608,456 | (105,065,544) |
| රජයේ ප්‍රදාන | 15,475,826,000 | 10,127,233,740 | (5,348,592,260) | 10,347,000,000 | 10,404,988,682 | 57,988,682 |
| | 17,611,826,000 | 12,230,213,548 | (5,381,612,452) | 11,583,000,000 | 12,212,595,941 | 629,595,941 |

| **වියදම** | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | සත්‍ය | විචලනය | අයවැයගත | සත්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 9,246,704,840 | 9,073,648,538 | 173,056,302 | 8,380,903,944 | 8,271,032,237 | 109,871,707 |
| අනෙකුත් පුනරාවර්තන | 2,774,081,661 | 2,181,727,156 | 592,354,505 | 2,462,730,607 | 1,826,468,557 | 636,262,050 |
| රාජ්‍ය ආයෝජන | 4,049,435,109 | 1,305,826,763 | 2,743,608,346 | 3,627,634,865 | 1,613,713,379 | 2,013,921,486 |
| | 16,070,221,610 | 12,561,202,457 | 3,509,019,153 | 14,471,269,416 | 11,711,214,173 | 2,760,055,243 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.12,561,202,457ක් විය. ඉන් සියයට 90 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 10 ක් රාජ්‍ය ආයෝජන විය.

## 4. වාණිජ අත්තිකාරම් ගිණුම්

### 4.1 ඌව පළාත් මුද්‍රණාලයේ අත්තිකාරම් ගිණුම

සමාලෝචිත වර්ෂයේ ඌව පළාත් මුද්‍රණාලයේ අත්තිකාරම් ගිණුමට අදාල ශේෂ වැය ලෙජර හා ලෙජර් ගිණුම් අතර රු. 504,151 කින්ද, ශේෂ පිරික්සුම හා ආදායම් ප්‍රකාශය අතර රු.6,580 කින්ද, ශේෂ පිරික්සුම හා ලෙජර් ගිණුම් අතර රු.433,592 කින්ද, වත්කම් ලේඛනය හා ගණුමේ ස්ථාවර වත්කම් උපලේඛනය අතර රු.101,357 කින්ද, වැය ලෙජරය හා සුළු මුදල් පොත අතර රු.19,982 කින්ද, මුද්‍රණාල ලේඛන හා ලෙජර් ගිණුම් අතර රු.16,822 කින්ද නොසැසඳුනි.

**4.2 ඔක්කම්පිටිය බීජ ගොවිපල වාණිජ අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනට වූ තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගයට ගිණුම්ගත නොකර විකුණුම් මිල වූ රු. 721,525 කට ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(ආ) වසර කිහිපයක සිට පැවත එන බැංකු ප්‍රකාශයේ රු.24,555 ක්වූ සෘජු තැන්පතු ගිණුම්ගත කිරීමට හා ගෙවිය යුතු රු.333,561 ක පිරිවැටුම් බදු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 බීජ අර්තාපල් ආනයනය කර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලු පුල්ලි රෝගය වැළදී ප්‍රතික්ෂේපිත බීජ අල සඳහා නෙදර්ලන්තයේ J. VAN DIJK DRONTEN BV ආයතනයෙන් අයකර ගැනීමට ඇති රු. 4,893,741 ක ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම් වල අනාවරණය කර නොතිබුණි.

(ආ) ලේඛන, ලෙජර් ගිණුම් හා ණයගැති උපලේඛන යනාදි වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා එකතුව රු.33,501,491 ක මුදලකට අදාල වූ ගනුදෙනු 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**5. මෙහෙයුම් සමාලෝචනය**

**5.1 කාර්ය සාධනය**

**5.1.1 අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්**

726-50-4-2103(2) (යන්ත්‍ර -වාහන සේවා කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම) දරන වැය විෂයය යටතේ වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් සලසා තිබුණ ප්‍රතිපාදනයෙන් රු. 4,000,000 න් රු. 3,461,783 ක් වැය විෂයයේ අරමුණු වලින් පරබාහිර කටයුතු සඳහා වැයකර තිබුණි.

### 5.1.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ අරමුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් පුස්තකාල ප්‍රඥප්තියේ iv කොටසේ 26.3 වගන්තියේ සඳහන් ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් ඉටුකළ යුතු සේවාවන් 15 න් 13 ක් ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි. ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැය කළ සමස්ථ වියදම රු. 2,626,236 න් සියයට 63 ක් අවිධිමත් ලෙස බඳවාගත් කාර්ය මණ්ඩල වෙනුවෙන් වැයකර තිබීම නිසා ආයතනයේ අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් සමස්ථ වියදමෙන් සියයට 37 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බලශක්ති හා පේෂකර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ පළාත් සංවර්ධන සැලැස්මෙන් අනුමත කර තිබුණ වැඩ යෝජනා 715 ක් ක්‍රියාත්මක නොකිරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණ. ඌව පළාතේ සංවර්ධන කටයුතු සඳහා මුදල් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තුන් අවුරුදු සැලැස්මේ විදුලිබල හා බලශක්ති අංශයට අදාල වැඩ යෝජනා 04 කට රු.මිලියන 16.9 ක ප්‍රතිපාදන සළසා තිබුණද එම වැඩ යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බදුල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ගිරාඳුරුකෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ලබාදී තිබූ ඉන්වොයිසි 03 ක අඩංගු ඖෂධ තොග පොත් වලට ඇතුළත් කර නොතිබුණ. ඖෂධ නිකුත් කිරීමේදී විධිමත් පාලනයක් නොමැතිවීම හේතුවෙන් කල් ඉකුත් වූ එන්නත් සහ ඖෂධ වර්ග 14 ක් මූලික රෝහල් ගබඩාව තුළ පැවතුණි.

(ආ) ඌව පළාත් සභාවේ 2011 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තියේ 51(1) (අ) වගන්තිය ප්‍රකාරව සෑම වර්ෂයකට වරක් රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද තැනැත්තකු හෝ ආයතනයක් ලවා සෑම සමුපකාර සමිතියකම ගිණුම් විගණනය කළ යුතු වුවත් 2011 වර්ෂයේදී ඉන් සියයට 50 ක ප්‍රගතියක් ලඟාකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඈ) දිසා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය විසින් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අයකර ගත යුතුව තිබූ හිඟ කුලී ගාස්තු රු.24,742,979 ක් වී තිබුණි. එම හිඟ කුලී ගාස්තුවෙන් රු.995,009 ක් පුද්ගලික ආයතන හා බාහිර පුද්ගලයන්ගෙන්ද, රු.8,602,620 ක් මධ්‍යම රජයට අයත් ආයතන වලින්ද අයවීමට තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මහජන ආධාර හා රෝගාධාර ගෙවීම් සඳහා මාසිකව තැපැල් දෙපාර්තමේන්තුව වෙත යවන ලද රු.182,001,457 ක මුදලින් රු.17,290,841 ක මුදලක් ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවීම නිසා ආපසු හරවා එවා තිබුණි.

(ඉ) බණ්ඩාරවෙල අධ්‍යාපන කාලපයට අයත් සිසුන් 93 ක ගෙන් යුත් විහාරගල දෙමළ විදුහලේ 2009 වර්ෂයේ ඉදිකරන ලද අඩි 60 x 20 ගොඩනැගිල්ල සඳහා විගණිත දින වූ 2013 සැප්තැම්බර් 25 දක්වාම විදුලි පහසුකම් ලබාදී නොතිබුණ අතර දීර්ඝ කාලයක සිට බෙහෙවින් අබලන්ව පවතින ප්‍රධාන ශාලාව හා එකම ගුරු නිවාසය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඊ) පස්සර අධ්‍යාපන කලාපයේ පාසැල්වලට රේඛීය අමාත්‍යාංශය, වෙනත් විවිධ ආයතන හා සංවිධාන මගින් ලබාදෙන විවිධ භෞතික සම්පත් සම්බන්ධයෙන් තොරතුරු කලාප අධ්‍යාපන කාර්යාලය සතු නොවූ අතර කලාප අධ්‍යාපන කාර්යාලය හා පාසැල් අතර සම්බන්ධීකරණය දුර්වල මට්ටමක පැවතුණි.

(උ) පාසැල් වෙත ලබාදී ඇති පරිගණක හා උපාංග නිෂ්කාර්යව පැවතීම, පරිගණක සම්බන්ධ ගුරුවරුන් නොමැතිවීම, උපකරණ ප්‍රයෝජනයට ගැනීමට යටිතල පහසුකම් නොතිබීම, ලබාදී ඇති බොහෝ උපකරණ අක්‍රීය තත්ත්වයේ පැවතීම, නිසි අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදු නොවීම, උපකරණ භාවිතා කිරීමට ප්‍රමාණවත් සිසු පිරිසක් නොසිටීම, බොහෝ පාසැල්වල ප්‍රතිඵල ඉතා පහළ මට්ටමක පැවතීම, විදුහල්පතිවරුන් සහ කලාප අධ්‍යාපන කාර්යාල අතර සන්නිවේදනය දුර්වලවීම සහ කලාපයට අයත් පාසැල්වලට ලබාදී ඇති උපකරණ හා ගුණාත්මක යෙදවුම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු කලාප අධ්‍යාපන කාර්යාල සතු නොවීම යන දුර්වලතා පස්සර අධ්‍යාපන කලාපයට අයත් පාසැල් තුළ පැවතුණි. එබැවින් එම කටයුතු පිළිබඳව පස්සර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් නිසි පසු විපරම් කිරීමක් කර නොතිබුණි.

(ඌ) සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දී තිබූ වාහන 12 ක ලියාපදිංචි සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2012 වර්ෂය තුළ සිදු වූ රිය අනතුරු දෙකකින් රු. 244,270 කවූ අලාභ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2011 වර්ෂයේදී ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ මාතෘ මධ්‍යස්ථානවලට උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදී තිබුණ රු.6,286,156 ක මුදලින් රු.412,000 ක් ආපසු යැවීමට කටයුතු නොකර රු.279,569 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා 2013 මාර්තු 05 දින ආදායමට බැර කර තිබුණි.

(ඔ) මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට 2012 සැප්තැම්බර් 28 දින ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ පරිගණක හා උපාංග 53 ක් ප්‍රයෝජනයට නොගෙන 2013 ජුනි 20 දින වනවිටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඕ) 2010,2011 හා 2012 වර්ෂවලදී මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගබඩාවට ලැබුණු විවිධ උපකරණ 77 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ක) මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය 2011 වර්ෂයේ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් විවිධ ආයතන නමින් නිකුත් කරන ලද රු.355,345 ක වටිනාකමින් යුතු චෙක්පත් 05 ක් 2013 ජුනි 28 දින වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බලශක්ති හා පේෂ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ සහ කාර්ය මණ්ඩලයේ රු.373,301 ක වැටුප් මුදලින් ගෙවා තිබුණි. අමාත්‍යවරුන්ට හෝ නිලධාරීන්ට වැටුප් හෝ දීමනා ගෙවීමේදී චෙක්පත් මගින් ගෙවීම් නොකර චෙක්පත් මුදල් කර ගෙවීම නිසා මුදල් අයථා පරිහරණය කිරීමට ඉඩ කඩ සැළසී තිබූ බව නිරීක්ෂණය විය.

## 5.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 13 ක වැය විෂයයන් 28ක් යටතේ වූ රු.33,404,400 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 712-3-7-2106-1 දරන වැය විෂයය යටතේ වෙන්කර තිබූ රු.30,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.17,668,159 ක් ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම් ලෙස හේතු දක්වා ඉතිරි කර තිබුණු අතර රු.15,000,000 ක් සඳහා පමණක් අග්‍රිම මුදල් ඉල්ලුම්කර තිබුණි.

(ඇ) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආධාර යටතේ පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 712-3-7-2106-2 දරන වැය විෂය යටතේ වෙන්කර තිබූ රු.15,000,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි කර තිබූ අතර, රු.2,000,000 ක් සඳහා පමණක් අග්‍රිම ඉල්ලුම්කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රකාශයෙන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල සඳහා වෙන්කළ රු.5,000,000 ක 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශයන්හි ලැබීම් වශයෙන්ද, ප්‍රතිපාදිත මුදලින් සත්‍ය වශයෙන් ලද රු. 4,500,000 ක මුදල පරිපූරක ඇස්තමේන්තු ලැබීම් වශයෙන්ද දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම රු. 9,500,000 ක් ලෙස රු.5,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු. 34,500 ක් වූ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය මූල්‍ය ප්‍රකාශයන්හි රු. 4,965,500 ක ආදායම් අතිරික්තයක් ලෙස දක්වා තිබූ අතර වර්ෂ අවසානයේ රු. 4,093,664 ක් විය යුතුව තිබූ සමුච්චිත අරමුදල රු. 4,133,664 ක් ලෙස රු.34,500 කින් වැඩියෙන් සාවද්‍ය ලෙස නිරූපනය කර තිබුණි.

## 5.5 අනුමත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම්

### රාජ්‍ය වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1 ජේදය ප්‍රකාරව වැටුප් හා වේතන ආශ්‍රිත අතිකාල දීමනා, අනිකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ වැය විෂයයන් 21 ක ප්‍රතිපාදන වලින් සියයට 2 ක් ඉතිරි කර නොතිබුණ අතර පුනරාවර්තන වැය විෂයක් සඳහා ප්‍රතිපාදන සියයට 02 ට අඩුවෙන් අවුරා තිබුණි.

(ආ) ඌව පළාතේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ වැය විෂයයන් 11 ක ප්‍රතිපාදනවලින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලෙඛයේ 02 ජේදය අනුව 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් සළසා තිබෙන පුනරාවර්තන හා මූලධන වියදම් ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 02 ක් හා සියයට 09 ක් ඉතිරි කර නොතිබුණි.

(ඈ) ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2012 නොවැම්බර් 15 දිනැති අංක පී/බීයුඩී/සීඅයිඅර්/ 2012 ලිපිය පරිද ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එක් මූලධන වැය විෂයක ප්‍රතිපාදන වලින් අවුරා තැබිය යුතු ප්‍රමාණයට වඩා රු.99,000 ක් අඩුවෙන් අවුරා තබා තිබුණි.

## 5.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පළාත් සභාව සතු පහත සඳහන් සමහර වත්කම් නිෂ්කරිය හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) ඌව පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල හා පාසල් 18 කට අයත් රු.2,055,541 ක් වටිනා භෞතික සම්පත් වසර 01 සිට වසර 10 ක කාලයක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ගිරාදුරුකෝට්ටේ රෝහලේ වකුගඩු ඒකකය සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සළසා නොමැති අතර ඉවත්කළ වෛද්‍ය උපකරණ පුටු, පරීක්ෂණ උපාංග යනාදිය ලෙඩුන් පරීක්ෂා කරන ස්ථානයේ රඳවා තිබුණ. විදුලි විසන්ධි වීමකදී රෝහල සතුව පැවති විදුලි ජනක යන්ත්‍රය උපයෝගී කරගෙන විදුලිය ලබාගැනීමට පහසුකම් සළසා නොතිබීම මත රෝගීන් පරීක්ෂා කිරීමටද නොහැකි වී තිබුණි.

(ඇ) විදුලිය අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යනයක් නොකර ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් සහ බෙදාහැරීම් අමාත්‍යාංශය විසින් මොණරාගල සහල් සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හේතුවෙන් කිලෝ වොට් 80 ක විදුලි ධාරිතාවක් නොලැබීම නිසා වී සහල් කිරීම අවස්ථා දෙකකදී සිදුකිරීමට සිදුව ඇත. ඒ අනුව පළමුවර වී වල පොතු ගැලවීමද, දෙවන වර සහල් සැකසීමද සිදුකරයි. දිනකට වී කිලෝග්‍රෑම් 7000 සහල කළ හැකි යන්ත්‍ර පද්ධතියකින් වී කිලෝග්‍රෑම් 3500 ක් පමණක් සහල් බවට පත් කිරීමට සිදුවීමෙන් යන්ත්‍රවල නියමිත ධාරිතාව ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ඈ) ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාහනයක් 2012 මැයි 14 දින සිට ධාවනයේ යොදවා නොතිබුණ අතර 2011 පෙබරවාරි 08 දිනැති අංක පීඑෆ්ඩී/ඒඑස්ඩී/04/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අලුත්වැඩියා කිරීමට හෝ භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන යටතේ උඩුවර මත්ද්‍රව්‍ය නිවාරණ හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා 2010, 2011 හා 2012 වර්ෂවලදී රුපියල් ලක්ෂ 50 ක ප්‍රතිපාදන ලබාදී තිබුණ නමුත් 2013 ඔක්තෝබර් මාසය වන විටත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුවී නොතිබුණි.

## 5.7 අවිධිමත් ගනුදෙනු

පළාත් සභාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත්බවින් තොර විය.නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) බලංගොඩ වැව්ලි සමාගමේ වත්තකට අයත් ආණ්ඩුකාර නිල නිවස පළාත් සභාවට පවරා ගැනීම වෙනුවෙන් 2009, 2010 හා 2011 වර්ෂවලදී බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි රු.8,500,000 ක මුදලක් තැන්පත් කර තිබුණි. 2013 මැයි මස දක්වා මෙම වත්කම පවරාගෙන නොතිබුණු අතර මෙම මුදල වසරකට අධික කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. එසේම එම වටිනාකම 700-3-2-2105 දරන වැය විෂය යටතේ කාර්යාලය විසින් අත්පත් කරගත් වත්කමක් ලෙස විසර්ජන ගිණුමෙහි ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ ලේකම්වරයාට 2008 ජුනි 26 දිනැති අංක 2008/14 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2012 ඔක්තෝබර් 08 දිනැති අංක BD/A/AO/BC දරන මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රවාහන දීමනා වශයෙන් මාසිකව රු.30,000 බැගින් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.1,500,000 ක් ද, මාසික ඉන්ධන දීමනා වශයෙන් එම කාලය සඳහා රු.1,017,048 ක්ද ගෙවා තිබුණ. එයට අමතරව රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා ආයතනයේ සංචිත වාහන භාවිතා කරමින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ඉන්ධන අත්තිකාරම් වශයෙන් රු.110,888 ක්ද ගෙවා තිබුණි.

(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා ජංගම දුරකථන 02 ක් රු. 36,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණි.

(ඈ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන සහ ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනගමනය කිරීමකින් තොරව මාසිකව රු.31,712 ක් ගෙවීමේ පදනම මත ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල පරිශ්‍රයේ 2009 ජුනි 01 දින සිට 2010 ජුනි 01 දින දක්වා වූ පවිත්‍රතා කටයුතු පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. 2010 ජුනි 01 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුවද ගිවිසුම අළුත්කිරීමකින් තොරව විගණන දිනය වූ 2013 ඔක්තෝබර් 08 දක්වාම මෙම ආයතනයේ සේවය ලබාගෙන තිබු නමුත් අදාල කාල පරාසය තුළ මෙම ආයතනය සඳහා කළ ගෙවීම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

ගිවිසුම අනුව පරිශ්‍රයේ අභ්‍යන්තර මෙන්ම අවට භූමියේ පවිත්‍රතා කටයුතුද අදාල ආයතනය විසින්ම සිදුකළ යුතුව තිබුණ නමුත් පරිශ්‍රය අවට භූමියේ පවිත්‍රතා කටයුතු සඳහා අනියම් උද්‍යාන කම්කරුවෙකට 2008 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා පළාත් පුස්තකාල සේවා මණ්ඩල ආදායමෙන් රු.119,930 ක් හා 2006 ඔක්තෝබර් 04 දින සිට 2012 අගෝස්තු 03 දින දක්වා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.738,934 ක් ගෙවා තිබුණි. එම ගෙවීම් වලට අමතරව පරිශ්‍ර භූමියේ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දෛනික පදනම මත සේවය ලබා ගත් කම්කරුවෙකුට රු.5,000 ක් ගෙවා තිබුණි.

## 5.8 හඳුනා ගන්නා ලද පාඩු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ හඳුනාගන්නා ලද පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දියතලාව ප්‍රාදේශීය ඉංජිනේරු (මාර්ග) කාර්යාලයේ වතු මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ නාය බැද්ද වත්ත හංදිය හරහා සෙන්ට්කැතරින් හංදිය බලගල මාර්ගය නායබැද්ද කොටස ඉදිකිරීමේදී වතු සමාගම් දායකත්වය නොලැබීමෙන් රු.30,567 ක මුදලක් කොන්ත්‍රාතකරුට වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.

(ආ) 2012 අප්‍රේල් 23 දින ගිනිගත්හේන කැනිල්වත්ත ප්‍රදේශයේදී අනතුරට භාජනය වී තිබුණ ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බලශක්ති හා පේෂකර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් වාහනයකට රු.1,394,165 ක හානියක් සිදුවී තබුණ අතර ඒ සඳහා රක්ෂණ සමාගමෙන් රු.1,029,418 ක වන්දියක් ලැබී තිබුණ. රක්ෂණ සමාගමෙන් අය නොවන රු.364,747 ක අලාභය සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නිල ඇඳුම් තොග ලේඛනය අනුව 2013 ජුලි 19 වන දිනට කාකි කලිසම් රෙදි ශේෂය මීටර් 1,967 ක් වූ අතර භෞතික ශේෂය මීටර් 1,105 ක් වුයෙන් කාකි කලිසම් රෙදි මීටර් 862 ක ඌණතාවයක් සිදු වී තිබුණි.

5.9 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

5.9.1 **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බණ්ඩාරවෙල සුජාතා සෙවන ළමා නිවාසයේ ජලනල මාර්ගය සහ ළිඳ අලුත්වැඩියාව සඳහා රු.415,774 ක් වැය කර තිබුණ අතර ප්‍රමිතියෙන් තොර 1 1/2 " ජීඅයි පයිප්ප භාවිතා කිරීම නිසා සැපයෙන ජලය සමඟ මලකඩ මිශ්‍රවන හෙයින් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

ජලය සැපයීම සඳහා එක් මෝටරයක් ප්‍රමාණවත්ව තිබියදී රු.580,946 ක් ගෙවා සෙන්ට්‍රික් Vms 100/4/35, 1`x1`වර්ගයේ ජල මෝටර් 02 ක් 2011 ඔක්තෝබර් 16 දින සවිකර තිබුණ අතර ඉන් එක් මෝටරයක භාවිතා කර රු.370,556 ක් වැය කර ඉදිකරන ලද පොම්පාගාරය ක්‍රියාවිරහිත වී තිබුණි.

රුපියල් මිලියන 1.6 ක් වැය කර පිරිසිදු ජලය ලබාගැනීමට ඉටුකල මෙම කර්මාන්තයෙන් නිසි පරිදි පානීය ජලය ලබාගැනීමට නොහැකිවීම මත 2011 මාර්තු සිට 2012 දෙසැම්බර් දක්වා ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයට ජලය ලබාගැනීම වෙනුවෙන් රු.520,506 ක් ගෙවා තිබුණි.

(ආ) එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොමැති කොන්ත්‍රාත්කාර සමිතියකට බොරලන්ද සත්ව ගොවිපල වටා වැට ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් කම්බි කණු 275 ක් සපයා ගැනීම සඳහා රු.50,976 ක එකතු කළ අගය මත බදු ඇතුළත්ව රු.674,850 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) බුද්ධම තලාගංගොඩ මාර්ගයේ බුද්ධම මංසන්ධිය පුළුල් කිරීමේ කර්මාන්තය සඳහා 2012 අගෝස්තු 06 දින මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු විසින් සිංහ ගොවි සංවිධානය සමඟ රු.1,708,159 ක ගිවිසුමකට එළඹ වැඩ අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කාර සමිතිය වෙත 2012 දෙසැම්බර් 28 දින රු.1,613,249 ක් ගෙවා තිබු අතර මංසන්ධිය නිසි පරිදි තලා නොතිබීම මත සේදී ගොස් වලවල් හැර තිබුණි.

රු.247,835 ක් වැයකර ඉදිකර තිබූ කොන්ක්‍රීට් කාණුවෙහි දෙපස පස් දමා තලා නොතිබුණ අතර ජලය බැසයන ආකාරය පිළිබඳව කිසිදු අධ්‍යයනයක් නොකර ඉටුකිරීම මත ගැවල් යොදා තලා ඇති බිම් කොටස මගින් වැසි ජලය බැසයන බව නිරීක්ෂණය විය.

(ඈ) අඹගස්දෝව දියකොළ අරාව මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා රු.1,668,293 ක් වැය කර තිබුණු අතර 2013 ජනවාරි 22 දින පරීක්ෂා කිරීමේදී යෙදිය යුතු පසාරන මූට්ටු සැලසුම් කළ පරිදි යොදා නොතිබීම, ආරම්භක ස්ථානයේ සිට මීටර් 80, 90 සහ 100 යන ස්ථානවලින් මාර්ගය හරහා පුපුරා තිබීම හා මාර්ගය දෙපස උරහිස් පුරවා තලා නොතිබීම යන අඩුපාඩු අනාවරණය විය.

(ඉ) 2012 වර්ෂයේ උපමාන පාදක ආයෝජන වැඩසටහන යටතේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ බෝගහකුඹුර, බිබිලිගමුව, ඉහළ මැදතුලාන මාර්ගයෙන් කුඹුරු යායට සම්බන්ධවන පැති බැම්ම හා බෝක්කුව තැනීම සඳහා රු. 414,509 ක් වැය වී තිබුණු අතර මෙම පැති බැම්ම හා බෝක්කුව පුද්ගලික එක් නිවසකට යන මාර්ගයක තනා තිබුණි. එම නිවැසියන්ද මෙම මාර්ගය විගණිත දිනය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර මෙම මාර්ගයෙන් එම නිවසට හැරෙන්නට වෙනත් නිවෙස්වලට හෝ කුඹුරුවලට යාමට හැකියාවක් නොතිබුණි. ඒ අනුව පැති බැම්ම හා බෝක්කුව ඉදිකිරීම සඳහා දරන ලද රු.414,509 ක්වූ මුදල එක් පුද්ගලයකුගේ ප්‍රතිලාභය සඳහා වැය කර තිබෙන අතර එම පුද්ගලයා හෝ ප්‍රයෝජනයට නොගන්නා නිසා එම මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඊ) රු.702,353 ක වියදමින් දිසා යාන්ත්‍රික කාර්යාලය සඳහා සකස් කරන ලද ප්‍රධාන ලිඳ ඒ අසලින් ගමන් කරන කාණු පද්ධතියකින් එකතුවන අපද්‍රව්‍ය නිසා 2010 ජුනි 10 දින සිට ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර ලිඳ සකස් කිරීමට පෙර අදාල කාණු පද්ධතිය පිළිබඳවඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් සැලකිලිමත් වී නොතිබුණි.

(උ) විකල්ප බලශක්ති සංවර්ධනය යටතේ සූර්යකෝෂ මගින් විදුලිය ලබාදීමට අදාල පිරිවිතර ලබාගැනීම සඳහා මාස 08 ක කාලයක් ගත වී තිබුණ අතර ජාතික විදුලිබල පද්ධතියෙන් ඌව පළාතේ විදුලිය ලබාදීමට නොහැකි නිවාස සංඛ්‍යාව 1,925 ක් වන නමුත් 2012 වර්ෂයේ සූර්ය කෝෂ මගින් නිවාස 20 කට පමණක් විදුලිය ලබාදී තිබුණි. 2012 වර්ෂයේදී කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 06 ක් අළුත් වැඩියා කිරීම සඳහා රු.2,500,000 ක මුදලක් තාක්ෂණ නිලධාරී වාර්තා නොමැතිව කුඩා විදුලි බලාගාර සමිති වෙත ගෙවා තිබුණි.

---

### 5.9.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) පළාත් සභා ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු.1,527,900 ක ඇස්තමේන්තුවකට ආරම්භ කරන ලද ඇලෑවෙල මාර්ගය පළල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2012 දෙසැම්බර් 31 දිනටරු.768,793 ක වියදම් කර තිබුණද 2013 පෙබරවාරි 19 දින වන විටත් එම ව්‍යාපෘතිය නිම නොකර අත්හැර තිබුණි.

(ආ) මැදගම කොහුකුඹුර සායන මධ්‍යස්ථානය නවීකරණය කරීමේ කර්මාන්තය 2011 දෙසැම්බර් 29 දින රු.4,217,653 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ආරම්භ කර එයින් රු.738,480 ක 2012 දෙසැම්බර් 31 දින වනවිට වියදම් කර තිබුණි. කර්මාන්තයේ ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් මෙම වැඩ නිම නොකර අත්හැර දමා තිබුණි.

(ඇ) ඉගිනියාගල දිසා රෝහලේ වෛද්‍ය නිල නිවස අළුතවැඩියාව හා කැප්පෙටිපොල විශාඛා පුහුණු පාසලේ මුරකුටිය, ගේට්ටුව හා පාර ඉදිකිරීමේ කර්මාන්ත රු.3,481,486 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ආරම්භ කර 2012 ෙසැම්බර් 31 දිනට රු.784,811 ක වියදමක් දරා තිබුණත් දැඩි වර්ෂාපතනය හා මාර්ගය වසා දැමීම යන හේතූන් මත ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයක විය.

### 5.10 අයවීමට ඇති සේවක ණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ගිණුම් 22 ක ශේෂවල එකතුව රු.95,350,116ක්වූ අතර, අවුරුදු 03 ට වැඩි කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.56,268,004ක් විය.

(ආ) ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් 1,396 දෙනෙකු වෙනුවෙන් නිරවුල් නොකළ ණය ශේෂ රු.52,686,535 ක හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 2,202 ක් වෙනුවෙන් අයවිය යුතු රු.89,926,352 ණය ශේෂ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/1 දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය අනුව ගිණුම් සාරාංශ මඟින් නිරවුල් කිරමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවය අතහැර ගිය, වැඩ තහනම් කළ, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 84 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.4,274,951 ක්වූ ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2, 4.5 වගන්ති අනුව විශ්‍රාම පරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ

අයකිරීමට හෝ නැතහොත් 4.6 වගන්තිය අනුව එම ණය ශේෂ අය කර ගැනීම සඳහා නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අත්තිකාරම් ගිණුමේ හර ශේෂයේ අක්‍රීය ණය ශේෂ ලෙස ඇතුළත්ව ඇති ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු.695,913 ක්වූ අය නොවී පවතින ණයගැති ශේෂ සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වන වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) ඌව පළාත් සභාවෙන් මධ්‍යම රජයේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 667 දෙනෙකුගෙන් රු.20,072,902 ක් සහ ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 993 දෙනෙකුගෙන් රු.42,343,543 ක් අයවිය යුතු සහ පියවිය යුතු ණය ශේෂ, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.2.1 හා 3.2.2 ජේද ප්‍රකාර එකවර අයකිරීමට හෝ ණය වාරික සහ පොලිය මාසිකව ගෙන්වා ගැනීමට හෝ පියවීමට කටයුතු කර නොතිබුණි.

## 5.11 වත්කම් කළමනාකරණය

### 5.11.1 ලේඛණගත නොකළ වත්කම්

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන සහ ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් ලද රු.432,990 ක්වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඌව පළාත් මුද්‍රණාලයට අයත් වත්කම් අයිතම් 217 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 5.11.2 භාණ්ඩ සමීක්ෂණය නොකළ ආයතන

(අ) ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 04 ක ඌව පළාත් සභා මුදල් රීති 756 හා 757 අනුව 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා නොතිබුණි.

(ආ) ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මොණරාගල සමුපකාර සංවර්ධන උපකොමසාරිස් කාර්යාලය හා සමුපකාර කළමනාකරණ පුහුණු ආයතනයේ 2012 වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණ ඌනතා සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති 757(2) ප්‍රකාර කටයුතු කර නොතිබුණි

## 5.12 බාහිර පාර්ශවන් වෙත ලබාදී ඇති වත්කම්

(අ) ඌව පළාත් ප්‍රතිපත්ති හා සැලැසුම් සම්පාදන දෙපාර්තමේන්තුව සඳහා රු. 6,126,904 ක් වැයකර 2009 වර්ෂයේ ඉදිකළ නිදන කාමර 06 ක් සහිත වර්ග අඩි 3500 ට ආසන්න දෙමහල් සංචාරක නිවාසය හා එහි මුළුතැන් ගෙයි උපකරණද, රු. 834,022 ක්වූ ගෘහ භාණ්ඩද අරමුණට පරිබාහිරව 2009 සැප්තැම්බර් 09 දින සිට කිසිදු අයකිරීමකින් තොරව බාහිර පුද්ගලයකුගේ භාවිතය සඳහා ලබාදී තිබුණ අතර 2011 පෙබරවාරි සිට 2013 පෙබරවාරි දක්වා බංගලා භාරකරු වෙත ගෙවා තිබු වැටුප රු. 500,201 ක් විය.

(ආ) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 09 පර්චස් 13 ක රජයේ ඉඩමක් රු.300 ක වාර්ෂික බදු මුදලකට කෘෂිකාර්මික කටයුතු සඳහා 1956 නොවැම්බර් 01 සිට 1966 නොවැම්බර් 01 දක්වා කාලයකට ගුරුතලාව ශාන්ත තෝමස් විදුහලට බදු දී තිබුණ. ඉඩම් බදු ගිවිසුම අළුත් කිරීමට හා බදු ගෙවීමට කටයුතු නොකර 2013 ඔක්තෝබර් 30 වන විටත් අඛණ්ඩව වසර 47 ක කාලයක් භාවිතා කරමින් ගිවිසුමට පටහැනිව එහි පුද්ගලික පාසලක් පවත්වා ගෙන ගොස් තිබුණි. ඉඩමේ මායිම් ආරක්ෂා නොකිරීම නිසා පුද්ගලයන් විසින් අක්කරයක පමණ කොටසක් අත්පත් කරගෙන තිබුණි. 1996 සිට අයවිය යුතු බදු මුදල ලෙස ගණනය කර ඇති රු. 2,212,500 ක් තුළ දඩ මුදල ඇතුළත්ව නොතිබු බැවින් නිවැරදිතාවය පිළිගත නොහැකි වූ අතර දඩ මුදල් සමඟ අයවිය යුතු බදු මුදල රුපියල් මිලියන 05 ක් ඉක්මවන බව නිරීක්ෂණය විය.

(ඇ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කහගොල්ල කෘෂිකර්ම පර්යේෂණ ආයතනයට අයත් හෙක්ටයාර් 1.117 ක්වූ රජයේ ඉඩම 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා රු.180,000 ක් සහ 2009 වර්ෂයේ සිට රු.270,000 ක්වූ වාර්ෂික බදු මුදලකට පෞද්ගලික ආයතනයකට ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 1998 දෙසැම්බර් 30 දින සිට වසර 50 ක කාලයකට බදු දී තිබු අතර 2004 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැරීම නිසා 2013 වර්ෂය අවසාන වන විට පොළියද ඇතුළුව පළාත් සභාවට අහිමි වී ගිය ආදායම රු. 2,700,000 ක් විය.

මෙම ආදායම් අයකර පළාත් සභාව වෙත ප්‍රේෂණය කිරීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබු අතර පළාත් සභාවද එම ආදායම් අයකර ගැනීමට සක්‍රීයව මැදිහත් වී නොතිබුණි.

## 5.13 කාර්ය මණ්ඩල පරිපාලනය

### 5.13.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) **පළාත් සභා, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ආයතනය - පාසැල් කාර්ය මණ්ඩලය හැර**

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 976 | 852 | 124 | - |
| තෘතියික මට්ටම | 2,828 | 2,308 | 520 | - |
| ද්විතික මට්ටම | 19,748 | 18,640 | 1,108 | - |
| ප්‍රාථමික මට්ටම | 4,260 | 4,764 | - | 504 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 21 | 426 | - | 405 |
| එකතුව | 27,833 | 26,990 | 1,752 | 909 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පති | 800 | 869 | - | 69 |
| ගුරුභවතුන් | 15620 | 15841 | - | 221 |
| වැඩසටහන් / කළමනාකරණ සහකාර හා නේවාසිකාගාර පාලක | 281 | 210 | 71 | - |
| කණිෂ්ඨ සේවකයින් | 856 | 1281 | - | 425 |
| **එකතුව** | **15,557** | **18,201** | **71** | **715** |

5.13.2 **ගුරු අතිරික්තය, ඌනාතවය හා අනුයුක්ත කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ බිලැක්වුඩ් අංක 01 දෙමළ විදුහලේ විෂයයන් 04 ක් සඳහා අතිරික්ත ගුරු සංඛ්‍යාව 05 ක් වූ අතර විෂයයන් 03 කට අදාල ගුරු ඌණතාවය 06 ක් වූයෙන් ගුරුතුලනය සඳහා කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයට අයත් දික්උල්පත ප්‍රඥාසාර විද්‍යාලයේ ඉංග්‍රීසි, නැටුම්, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයන් සඳහා පිළිවෙලින් 3,2 හා 2 බැගින් වූ ගුරු අතිරික්තයක් පැවතුණ අතර මෙම පාසැලෙන් වැටුප් ලබමින් වෙනත් පාසැල් වලට අනුයුක්තව සේවය කරන ගුරුවරු 06 දෙනෙකුද සිටින බැවින් ගුරු තුලනය ඇති කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) හල්දුම්මුල්ල කොට්ඨාශයට අයත් පාසල් 08 ක ප්‍රාථමික ගුරු ඌනතාවය 08 ක්වූ අතර පාසැල් 18 ක ඉංග්‍රීසි ගුරු ඌනතාවය 18 ක් විය.

(ඇ) බදුල්ල අධ්‍යාපන කලාපයේ බදුල්ල රාහුල විදුහලේ 1 සිට 5 වසර දක්වා සිටින මුළු සිසුන් සංඛ්‍යාව 66 ක් වන අතර ප්‍රාථමික ගුරුවරුන් 06 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. නිශ්චිත කාල සටහනක් නොමැති ගුරුවරුන් සංඛ්‍යාව තිදෙනෙක් විය. ගෘහ ආර්ථික විද්‍යාව සඳහා අවශ්‍ය වනුයේ එක් ගුරුවරයකු වුවද ගුරුවරු තිදෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඉංග්‍රීසි විෂය සඳහා පාසැලේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව අවශ්‍ය ගුරුවරුන් ගණන 03 ක් වුවද ඉංග්‍රීසි ගුරුවරු 06 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 222 ක් වන අතර මුළු ගුරුවරු සංඛ්‍යාව 53 ක් වීමෙන් එක් ගුරුවරයෙකුට වැටෙන ශිෂ්‍ය සංඛ්‍යාව 4 කි. මෙම විද්‍යාලයේ විශාල ගුරු අතිරික්තයක් පවතින අතර ඔවුන්ට2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කාල සටහනක් ලබා දී නොතිබුණි.

මේ නිසා නියමිත පරිදි කාල සටහන් ලබාදී ඇති ගුරුවරුන් අධෛර්යයට පත්වී තිබුණු අතර ගුරුවරුන්ගෙන් නිසි ඵලදායිතාවයක් ලබාගැනීමට අපොහොසත්ව තිබුණි. කලාපය තුළ හා පළාත තුළ දුෂ්කර පාසැල්වල විශාල ගුරු හිඟයක් පවතින අතර පාසැල් අතර ගුරු තුලනයක් කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. මෙම විද්‍යාලයේ ගුරුභවතුන් 21 කගේ සෙවා කාලය වසර 08 කට වඩා වැඩි විය.

(ඉ) බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ පාසැල් 20 ක විදුහල්පතිවරුන් 20 ක් අඛණ්ඩව වසර 14 ත් 30 ත් අතර සේවා කාලයක් සහිත විය.

---

(ඊ) බදුල්ල අධ්‍යාපන කලාපයේ බදුල්ල විහාරමහා දේවි බාලිකා විදුහලේ අතිරික්ත ගුරු සංඛ්‍යාව 14 ක්වූ අතර වසර 08-14 ත් අතර අඛණ්ඩ සේවා කාලයක් සහිත ගුරුවරුන් සංඛ්‍යාව 30 ක් විය.

### 5.13.3 ගිරාදුරුකෝට්ටේ රෝහලේ වකුගඩු ඒකකය

දිනකට රෝගීන් 200 දෙනෙකුට ආසන්නව ප්‍රතිකාර ලබන ගිරාදුරුකෝට්ට රෝහලේ වකුගඩු ඒකකයට එක් හෙදියක් සහ එක් උපස්ථායකවරයෙක් පමණක් අනුයුක්ත කර තිබණු අතර ඔවුන් දීර්ඝ කාලයක සිට එම ස්ථානයේම සේවයේ නිරතව සිටින බව නිරීක්ෂණය විය.

### 5.13.4 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රියදුරෙකු වර්ෂ තුනක කාලයක් අවිධිමත් ලෙස ඌව පළාත් අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

### 5.13.5 බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 06 උනැත අංක ඩීඑම්එස්බී/1/ඌව/අමා.සංස්/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සඳහා අනුමත කර තිබූ තනතුරු 06 ක් සඳහා 2013 ඔක්තෝබර් 08 දින වන විටත් නිලධාරීන් බඳවාගෙන නොතිබුණු අතර දීර්ඝ කාලයක සිට පුස්තකාල සේවා මණ්ඩල ආදායමෙන් දෛනිකව රු. 500 ක දීමනාවක්ද, සේවක අර්ථසාධක හා සේවා නියක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායකයන්ද ගෙවමින් නිලධාරීන් 09 දෙනෙකු තාවකාලික හා අනියම් පදනම මත සේවයේ යොදවා ගෙන තිබුණි.

(ආ) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ පත්කිරීම් පිළිබඳ අධිකාරයේ (i) විධිවිධාන අනුව ඌව පළාත් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන ලද මාසිකව රු. 37,500 ක පාරිශ්‍රමිකයක් හා පළාත් සභාවට අයත් වාහනයක් භාවිතා කරන ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිවරයා සම්බන්ධයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ ඔහුගේ කාර්යභාරය, වගකීම, පාරිශ්‍රමිකය හා සේවා කොන්දේසි පිළිබඳ කිසිදු විධිවිධානයක් සඳහන් නොවීමෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීම උදෙසාවූ ඔහුගේ දායකත්වය විගණනයට සනාථ නොවුණි.

## 5.14 බැංකු සැසඳුම්

බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී ආයතන 04 කට අදාලව හඳුනා නොගත් හර ශේෂ වටිනාකම රු.1,179,972 ක්වූ අතර ආයතන 04 කට අදාලව හඳනා නොගත් බැර ශේෂවටිනාකම රු.4,100,588 ක් විය.

## 5.15 පළාත් පාලන ආයතන අධීකෂණය

පළාත් සභාවේ අධීක්ෂණය හා පාලනයට යටත් වන ඌව පළාත තුළ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 28 ක පහත සඳහන් ඌනතා සැලකිල්ලට ගත්විට එම අධීක්ෂණ කටයුතු සතුටුදායකව ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.

### 5.15.1 පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ඌව පළාත තුල පිහිටි පළාත් පාලන ආයතන 28 ක් අතුරින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නියමිත දිනට පළාත් ආයතන 06 ක් පමණක් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

### 5.15.2 හිඟ ආදායම්

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් එකතුව රුපියල් 6,072,910 ක් හිඟව තිබුණි.

(ආ) 1979 අංක 42 දරන මහා නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට අයවිය යුතු උසාවි දඩ හා මද්දර ගාස්තු ආදායම් රුපියල් 92,799,862 ක් පළාත් පාලන ආයතන වෙත ලැබී නොතිබුණි.

### 5.15.3 නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

වර්ෂය අවසානයට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරින්ට හා නියෝජිතයන්ට පනවා තිබුණු අධිහාර වෙනුවෙන් රුපියල් 7,384,154 ක් අයවීමට තිබුණි.

## 06. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 6.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2011 වර්ෂයෙන් ආරම්භක ඉදිරි වර්ෂ තුනක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද රෝහල් 06 ක, මධ්‍යම බෙහෙත් ශාලා 20 ක් සහ ඔස උයන් 02 ක් පැවතියද ආයුර්වේද රෝහල් 06, මධ්‍යම බෙහෙත් ශාලා 19 ක් සහ ඔසු උයනක් සමාලෝචිත වර්ෂය තුළ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මාර්ග නඩත්තුවට හා මාර්ග පුනරුතථාපනය වෙනුවෙන් ව්‍යාපෘති 215 ක් සහ විශේෂ අවස්ථා සහ අවිච්ඡේද කර්මාන්ත සඳහා රුපියල් මිලියන 300 ක් වෙන් කර තිබුණ අතර එම ප්‍රමාණය පළාත් සභාවේ මුළු මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 8.6 ක් විය. මෙම මූලධන වියදම් අධීක්ෂණය සඳහා ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වැඩසටහන් ද පිළියෙල කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය සහ කෘෂිකර්ම උපදේශක කාර්යාල ඇතුලු ආයතන 60 කන් කිසිම ආයතනයක සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

(ඈ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින බදුල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මූලික රෝහල් 04 ක, දිසා රෝහල් 51 ක, මධ්‍යම බෙහෙත් ශාලා 27 ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 13 ක ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර ආයතන 95 කින් ආයතන 02 ක අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපති වෙත ලැබී තිබුණි.

(ඉ) ඌව පළාතේ පළාත් පාලන ආයතනවල සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.3 විගණන හා කළමනාකරණ කමිටු

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු15 ක විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඈ) අභ්‍යන්තර විගණනය

(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

(ඊ) සේවක මණ්ඩලකළමනාකරණය

(උ) වත්කම් කළමනාකරණය

(ඌ) කොන්ත්‍රාත් කළමනාකරණය